උඩරට නර්තන සම්ප්‍රදාය.

# Covid – 19 සති පාසල (සබරගමුව)

කාර්යය පත්‍රිකාව

නර්තනය - 9 ශ්‍රේණිය

11- වාරය

මැයි මාසය තෙවන සතිය, (මැයි 18 සිට මැයි 22 දක්වා කාලය)

---

- නිපුණතාවය :සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනා ගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශනය කරයි.
- පාඩම : සරඹ පද වාදනය කරමු(මැදුම් තනි තිතට අදාල බෙර පද {3+3} ).
  මෙම පාඩමට අදාලව පහත ක්‍රියාකාරකම් ඔබ විසින් සිදුකල යුතුව ඇත.



පළමු පියවර : ඔබ, 8 ශ්‍රේණියේදි සතර බීජාක්ෂර හා තනි තිතේ බෙර පද වාදනය කලා ඔබට මතක ඇති මතක නැතිනම් සටහන් පොත බලා එම පද නැවත මතකයට නගා ගන්න.

දෙවන පියවර : ඔබ දන් රූප සටහනේ පරිදි භාවනා කිරීමේ ඉරියව්වෙන් වාඩිවෙන්න. (එරමිණියගොතාගෙන). (ඔබගේ වම් දණහිස බෙරයේ වම් ඇස ලෙසත් දකුණු දණහිස බෙරයේ දකුණු ඇස ලෙස සිතන්න.)

තුන්වන පියවර : අපි දැන් 9 ශ්‍රේණියට අදාල බෙර පද වාදනය කරන අයුරු බලමු. මෙහි සඳහන් පද හතර වාදනය කිරීමට උත්සාහ කරන්න.

තත්කඩ - ''තත්'' යන අක්ෂරය වම් බෙර ඇසෙන් වාදනය කළ පසු ''කඩ'' යන පද කොටස දකුණු බෙර ඇසෙන් වාදනය කළ යුතු ය. ''ක'' යන්න සුළැඟිල්ලේ සිට මැදැඟිල්ල දක්වා බෙර මුහුණතෙහි වදින සේ ද "ඩ" යන්න දබරැඟිල්ල වදින සේ ද වාදනය කළ යුතු ය.

ජිත්කඩ - දකුණු බෙර ඇසෙන් "ජිත්" වාදනය කිරීමේ දී දකුණතේ සුළැඟිල්ලේ සිට මැදැඟිල්ල දක්වා කොටස භාවිත කරමින් දකුණු බෙර ඇසේ මැදට ගසා "ජිත්" අක්ෂරය උපදවා ගත යුතු ය. මෙහි දී ධ්වනිගුණයේ ගුණාත්මක බව ආරක්ෂා කරගැනීම උදෙසා වම් අත්ලේ ඇඟිලි සහිත කොටසින් වම් බෙර ඇස මඳ වශයෙන් තද කිරීමක් සිදු කෙරේ. පෙර පරිදි "කඩ" යන පද කොටස වාදනය කළ හැකි ය.

තොංකඩ - ''තොං'' යන පද කොටස බෙරයේ වමෙන් වාදනය කළ යුතු අතර ඒ සඳහා අතේ මහපටැඟිල්ල හැර ඉතිරි ඇඟිලි හතර එක් කොට කැපුම් හම ආසන්නයට වාදනය කළ යුතු ය. ''කඩ'' යන පද කොටස පෙර ආකාරයට ම වාදනය වේ.

නංකඩ - ''නං'' යන අක්ෂරය වාදනය කිරීමේ දී සුළැඟිල්ලේ සිට මැදැඟිල්ල තෙක් ඇඟිලි තුන එක්කොට අත්ල මඳක් ඉහළට එසවෙන ආකාරයට බෙරයේ මැද කොටසත් කැපුම් හමත් අතරට ගසා අක්ෂරය උපදවා ගත යුතු ය. 'කඩ' යන පද කොටස පෙර ආකාරයට ම වාදනය වේ.

**ජිං ගත ගොගො ( ''යන බෙර පදය වාදනය කළ යුතු ආකාරය විමසා බලමු)**

ජිං - සුළැඟිල්ලේ සිට මැදඟිල්ල තෙක් ඇඟිලි තුන එක්කොට බෙරයේ දකුණු ඇසේ ඉහළට හඬ විහිදී යන ආකාරයට වාදනය වේ

ග - මහපට ඇඟිල්ල හැර ඉතිරි ඇඟිලි හතර එක් කොට බෙරයේ වම් ඇස මැදට වාදනය වේ

ත - මහපට ඇඟිල්ල හැර ඉතිරි ඇඟිලි හතර එක් කොට බෙරයේ දකුනු ඇස මැදට වාදනය වේ

ගො - අතේ මහපට ඇඟිල්ල හැර ඉතිරි ඇඟිලි හතර එක් කොට කැපුම් හම ආසන්නයට (බෙරයේ වම් ඇසට) වාදනය කළ යුතු ය.

හතරවන පියවර : පහත බෙර පද කොටස් තාල තබන්න,පාඩම් කරන්න.

පස්වන පියවර : එම පද වාදනය කිරීමට උත්සාහ කරන්න. අලංකාර පදයද වාදනය කිරීමට පුහුණුවන්න.

උඩරට නර්තන සම්ප්‍රදාය
තිත් රූපය - 3+3 (මැදුම් තනි තිත)
බෙර පදය - ජිං ග ත ගොගො
අලංකාර පදය - ජිං කඩ තක ජිං රුකු තක

සැකසුම - නිවිතිගල කලාප අධ්‍යාපන කාර්යාලීය
සෞන්දර්ය අංශය වෙනුවෙන්,
එම්. ඒ. රංගන එම්. මුණසිංහ මයා,
රඹුක මහා විද්‍යාලය,
පොතුපිටිය, කලවාන.
voice - 0719227246